Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa

**පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න**

01) පරිමාව 10 $dm^3$ වන X නැමැති භාජනයක් තුළ $H_2$ වායුව හා යකඩ කුඩු 11.8 kg අඩංගු වන අතර එහි පීඩනය $1 \times 10^5$ Pa වේ.Y නැමැති පරිමාව 5 $dm^3$ වන භාජනයක් තුළ $N_2$ හා $O_2$ වායුව අඩංගු වන අතර එහි පීඩනය $2 \times 10^5$ Pa වේ. X හා Y බඳුන් දෙකම 27 $^0$C පවතින අතර $H_2$ හා $O_2$ සම මවුල ප්‍රමාණයක් අඩංගු වේ. X හා Y බඳුන් දෙක පරිමාව නොගිණිය හැකි තරම් කුඩා කේශික නළයකින් සම්බන්ධ කර උෂ්ණත්වය 539 $^0$ C දක්වා රත් කරන ලදී. සමතුලිත අවස්ථාවේ $NH_{3\,(g)}$ 0.08 mol සෑදී ඇති බව නිරීක්ෂණය විය. (යකඩවල ඝනත්වය 7860 $kgm^{-3}$ /මෙම තත්ත්ව යටතේදී $H_2$ හා $O_2$ ප්‍රතික්‍රියා නොකරන බව උපකල්පනය කරන්න/ R × 300 K = 2500 J $mol^{-1}$ / R × 812 K = 6750 J $mol^{-1}$ )




a) ආරම්භයේ X හා Y භාජන දෙකෙහි අඩංගු එක් එක් සංඝටකයේ මවුල ගණන සොයන්න
b) ප්‍රතික්‍රියාව අවසානයේ එක් එක් සංඝටකයේ මවුල ගණන සොයන්න
c) පද්ධතියේ $K_p$ සොයා එමඟින් $K_c$ ගණනය කරන්න
d) $NH_{3\,(g)}$ සාන්ද්‍රණය 1.2 mol $dm^{-3}$ දක්වා වැඩි කිරීමට නම් භාජනයට එකතු කළ යුතු $N_2$ ප්‍රමාණය ගණනය කරන්න

02)

a) pH අගය 3.5 වන ස්වාරක්ෂක ද්‍රාවණයක් තුළ AgCN වල ද්‍රාව්‍යතාවය සොයන්න
b) මෙම ද්‍රාවණ 100 $cm^3$ $AgNO_3$ 0.85 g එක් කළ විට ද්‍රාවණයේ $CN^-$ සාන්ද්‍රණය සොයන්න
c) එමගින් ද්‍රාවණයේ pH අගය සොයන්න
d) මෙම ගණනය කිරීම්වලදී ඔබ කළ උපකල්පන මොනවාදැයි ලියා දක්වන්න

- $K_{sp}$ (AgCN) = $2.2 \times 10^{-16}$ $mol^2$ $dm^{-6}$
- $K_a$ (HCN) = $6.2 \times 10^{-10}$ $mol^2$ $dm^{-6}$